# 20 රන් පිහාටු

පන්සිය පනස් ජාතක පොත කුරුණෑගල යුගයේ රචනා වූ වැදගත් ම සාහිත්‍ය කෘතියයි. එය තරම් සිංහල ජන ජීවිතයට බලපෑ තවත් කෘතියක් නැති තරම් ය. බෝසත් චරිතය මුල්කොට ගත් කථා වස්තු පන්සිය හතලිස් හතක් ඇතුළත් ව තිබේ. සිංහල බෞද්ධ ජනතාව එම කථාන්දරවලට සමූහ වශයෙන් සවන් දී ධර්ම උපදේශ මෙන් ම ධාර්මික විනෝදාස්වාදය ද ලැබූහ. එම ජාතක කතා අතුරෙන් ස්වර්ණ හංස ජාතකය මෙහි විරිඳුවට නඟා ඇත. **දැඩි ලෝභය දුකට පත්වීමට හේතු වේ** යන්න මේ කතා වස්තුවෙන් දෙන ප්‍රධාන පණිවුඩය යි.

1. තෙරුවන් සරණයි ඔබහට - සැමගෙන් අවසර මාහට
රණහස ජාතක කථාව - විරිඳුවලින් පැවසීමට

2. මහ බෝසත් උතුමාණෝ - පෙර කළ පිං බල මහිමෙන්
උපන්නෝ ය හිමාලයේ - ස්වර්ණ හංසයකු විලසින්

3. පෙර දිවියෙහි සිල් රැකලා - යහගුණ දම් ඔප කරලා
පෙර අත්බව දකින පිනක් - ස්වර්ණ හංසහට ලැබිලා

4. පෙර බවයේ අඹුදරුවන් - අසරණ වී දුක් විඳිමින්
බැලමෙහෙවර කරන අයුරු - දුටුවා තම පින් බලයෙන්

5. ස්වර්ණ හංස හිත පුරවා - දරු සෙනෙහස මතු වූවා
ඔවුනට සරණක් වන්නට - පෙර නිවහන වෙත ආවා

6. බිරිය සමග දරු තිදෙනා - දුටුව සැණින් රණ තිසරා
පෙර බවයේ තම වගතුග - ඔවුනට හෙළි පෙහෙළි කළා

7. හංසයා රන් පිහාටුවක් - ගලවා බිරිඳට දෙනවා
නැවතත් එන බව පවසා - හිමවත වෙත පියඹනවා



8. දුප්පත්කම නැති වෙනවා - බැලමෙහෙවර නවතිනවා
හංස පිහාටුව විකුණා - පවුල ම ජීවත් වෙනවා

9. දින එක දෙක ගත වුණා - බත බුලතින් සරුවුණා
තණ්හාවෙන් පිරුණු බැමිණි - දියණිවරුන් අමතනා

10. රණ හංසය අල්ලාගෙන - පිහාටු හැම ගලවා ගෙන
ඉක්මනින් ම පොහොසත් වෙමු- එයයි ඇගේ යෝජනාව

11. එපා අම්මෙ එක වරක දී - පිහාටු සැම ගලව ගන්න
පියාණන්ට නොහැකි වේවි - යළි අහසට පියාඹන්න

12. දූවරුන්ගෙ ඇවිටිලි සැම - ඉවත දමූ මවු බැමිණිය
රණ තිසරා අල්ලා ගෙන - ගලව ගත්ත පිහාටු සැම

13. ගලවන ලද පිහාටු කිසි - එකක් නොමැත රන් වූයේ
සීමා නැති ආශාවෙන් - තිබුණු දෙයත් නැති වූයේ

14. අසරණ වූ ස්වර්ණ හංස - එම නිවසෙහි තනිවෙනවා
නැවත පියාපත් ආවත් - ඒ සියල්ල සුදු වෙනවා

15. සුදු පිහාටු වැඩුණු පසු ව - හංස රාජ පියඹනවා
යළි කිසි දා නොඑන පරිදි - හිමාල වනයට යනවා

16. ලද පමණින් සතුටු නොවූ - ලෝබ සිතට අවනත වූ
බැමිණි නිසා අහිමි වුණා - සැපත සතුට හිමි ව තිබූ

17. දුක් දොම්නස් ඇති වුණා - හද සෝගිනි ඇවිළුණා
නැති බැරිකම් අගහිගකම් - අහස උසට පැමුණුණා

18. ගෙදර අයට රන් පිහාටු - එකක් බැගින් පුද කළේ ය
ගොඩක් ගන්න ගිහින් බිරිය - කළගුණ අමතක කළා ය

19. ස්වර්ණ හංස කතා පුවත - දිග හැරුණා විරිදු ලෙසට
පසක් වේ ය මේ පුවතින් - තන්හාදීනව මොනවට

20. ලද දෙයකින් සතුටු වෙන්න - සරල ව දිවි මඟ ගෙවන්න
සැනසිල්ලෙන් කල් අරින්න - නිරතුරු සැම සිතට ගන්න

## සාරාංශය



බෝසතාණෝ එක් භවයක ස්වර්ණ හංසයෙක් ව ඉපදුණහ. පෙර පින් බලෙන් ජාතිස්මරණ ඥානය ලැබූ මේ හංසයාට තමාගේ පෙර භවය දැකිය හැකි විය. දරු දෙදෙනෙකු හා බැමිණිය සමග තමා සතුටින් ජීවත් වූ බවත් හදිසියේ ම සිදු වූ තමාගේ මරණයෙන් දරු පවුල අසරණ වූ බවත් දුටුවේ ය. බැලමෙහෙවර කරමින් අසරණ ව ජීවත් වූ තම දරු පවුලට පිහිට වීමට අදහසක් හංසයාට පහළ විය. දිනපතා තමාගේ රන් පිහාටුවක් බැගින් දමා ගියේ ය. රන් පිහාටු විකුණා ඔවුහු ජීවිතය සැපවත් කර ගත්හ. දිනක් ඉක්මනින් ධනවත් වීමට සිතූ බැමිණිය දරුවන්ගේ විරෝධය නොතකා හංසයාගේ පිහාටු එක වර ගැලවීමට තීරණය කළා ය. එසේ ගැලවූ පිහාටු එකක් වත් රන් නොවූ අතර බැමිණිය තමා කළ මෝඩ ක්‍රියාවෙන් පසුතැවීමට පත් වූවාය. දැඩි ලෝභය විනාශයට මෙන් ම පිරිහීමට ද හේතු වන බව ජාතක කථාවෙන් අපට දෙන පණිවිඩයයි.

## ක්‍රියාකාරකම්



01. පහත සඳහන් වචනවල අර්ථය ලියන්න.

| | | |
|---|---|---|
| I | පෙර භවයේ | - |
| II | සරණක් වන්නට | - |
| III | නපුරු ක්‍රියා | - |
| IV | යහගුණ | - |
| V | අඹු දරුවන් | - |

02. මෙම කතා පුවත නාට්‍යානුසාරයෙන් රඟ දක්වන්න.

03. පන්සිය පනස් ජාතක පොතෙහි සඳහන් ස්වර්ණ හංස ජාතකය, ජාතක දේශනා ශෛලියෙන් කියවන්න.

## පැවරුම



ඔබේ පන්තියේ සෙසු අය සමඟ අසරණ අයෙකුට පිහිටවීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න.